# සුපිළිපන්

ට්‍රාන්ස්පේරන්සි
ඉන්ටනැෂනල්
ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

නො 6, 37 වෙනි පටුමග, රැජින පාර, කොළඹ 03
දුරකථනය - 011 4369781 ෆැක්ස් - 011 2506419
ඊ මේල් - tisl@tisrilanka.org
වෙබ් අඩවිය - www.tisrilanka.org



## දූෂණයට එරෙහි පුළුල් සංධානයක් බිහිවෙයි

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ පූර්ණ මැදිහත්වීමෙන් මෙරට පවත්නා ප්‍රධානතම වෘත්තීය සමිති හා සිවිල් සංවිධාන ඒකාබද්ධව පසුගියදා දූෂණයට එරෙහි පුළුල් සංධානයක් පිහිටුවාගනු ලැබීය.

දූෂණයට එරෙහි සන්ධානය නමින් පිහිටුවාගනු ලැබූ මෙම පුළුල් සන්ධානය ජනගත කිරීම පසුගිය ඔක්තෝබර් 31 වනදා සවස කොළඹ දී උත්කර්ෂවත් අන්දමින් සිදුකෙරිණි. මෙම සංධානයට මේ වන විට වෘත්තීය සමිති, සිවිල් සංවිධාන, වෘත්තීයවේදීන්ගේ සංගම් ජනමාධ්‍ය සංවිධාන ඇතුළු විවිධ සංවිධාන 50ක ට වැඩි සංඛ්‍යාවක් එක්ව සිටී.

කොළඹ නව නගර ශාලාවේදී පැවති සංධානය ජනගත කිරීමේ උත්සවයට එක්වූ සියලු සංවිධාන නියෝජිතයින් එහිදී රටතුළ සිදුවන සියලු දූෂණයන්ට එරෙහිව කටයුතු කරන බවට ප්‍රතිඥා ලබා දුන්හ.

මෙම සංධානය පිහිටුවීමට පෙරාතුව සිවිල් සංවිධාන, වෘත්තීය සමිති හා විද්වත් වෘත්තියවේදීන්ගේ සංගම් නියෝජිතයින් දීර්ඝ සාකච්ඡා ගණනාවක නිරත වූහ.

දූෂණයට එරෙහි සංධානයේ අරමුණ හා ප්‍රතිපත්ති මෙන්ම ක්‍රියාකාරකම් පිළිබඳව ද තීරණ ගැනීම ක්‍රියාකාරී කමිටුවක් හරහා සිදු කෙරේ.

එම සංධානයේ ක්‍රියාකාරී කමිටුව ලේකම් මණ්ඩලයකින් සමන්විත වන අතර එහි ලේකම් කාර්යාලය පවත්වාගෙන යාමේ වගකීම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් දරනු ලැබේ.

සංධානයේ අරමුණු හා ප්‍රතිපත්ති පිළිගන්නා, ඕනෑම සිවිල් සමාජ සංවිධානයකට හෝ වෘත්තීය සමිතියකට **නො 6, 37 වෙනි පටුමග, රැජින පාර, කොළඹ 03** ලිපිනයට ලිවීමෙන් දූෂණයට එරෙහි සංධානයට සම්බන්ධ විය හැකිය.

සංධානයේ අරමුණු
1. රටතුළ සිදුවන සියලු ආකාරයේ දූෂණ, වංචා සහ අක්‍රමිකතාවන්ට එරෙහි වීම.
2. පොදු දේපළ අයථා පරිහරණය වැළැක්වීම.
3. තොරතුරු ලබාගැනීමේ සහ දැනගැනීමේ අයිතිය නීතිගත කිරීම.
4. රජයේ මූල්‍ය විනිවිදභාවය නීතිගත කිරීම.
5. පාර්ලිමේන්තුවේ මූල්‍ය අධීක්ෂණ ආයතන ශක්තිමත් කිරීම සඳහා බලපෑම් කිරීම.
6. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාව ඇතුළු අනෙකුත් කොමිසන් සභා ස්වාධීන කිරීම සහ ශක්තිමත් කිරීම.
7. නීතියේ ආධිපත්‍යය බිඳවැටීමට හේතු ඇති දූෂිත ක්‍රියාකාරකම් නතර කිරීමට බලපෑම් කිරීම.
8. දූෂණයට එරෙහිව හඬ නගන්නන් හා හෙළිදරව් කරන්නන් ආරක්ෂා කිරීම සඳහා අණපනත් පැනවීමට පෙළඹවීම.

## TISL නව විධායක අධ්‍යක්ෂ

රාජ්‍ය අංශයේ කළමණාකරණ ක්ෂේත්‍රයේ වසර 30 කට වඩා වැඩි අත්දැකීම් ඇති ජ්‍යෙෂ්ඨ පරිපාලන සේවා නිලධාරියකු වූ එස්. රනුග්ගේ මහතා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා නව විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් පසුගියදා වැඩ භාර ගත්තේය.



අමාත්‍යාංශ කිහිපයක ලේකම්වරයකු හැටියටත්, දෙපාර්තමේන්තු කිහිපයක ප්‍රධානියා හැටියටත් සේවය කර ඇති ඔහු ශ්‍රී ලංකා පරිපාලන ආයතනයේ කළමනාකරණ උපදේශකයකු හා කොළඹ විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයකු ද වේ.

ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ දෙවැනි පංතියේ ගෞරව උපාධිධරයෙකි. නෙදර්ලන්තයේ හේග් නුවර සමාජ අධ්‍යයන ආයතනයේ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් දිනා ගෙන ඇති ඔහු මහජන ප්‍රතිපත්ති සහ පරිපාලනය පිළිබඳ විශේෂඥයෙකි. අමෙරිකා එක්සත් ජනපදයේ නිව් යෝර්ක් සිටි සරසවියේ හන්ටර් කොලීජියෙන් නාගරික සැලසුම් කිරීම පිළිබඳ වෘත්තීය සහතිකයක් ලබා ඇති රනුග්ගේ මහතා අමෙරිකා එක්සත් ජනපදයේ බොස්ටන් සරසවියෙන් සෞඛ්‍ය කළමනාකරණය පිළිබඳ උසස් සහතිකයක් ද හිමි කර ගෙන ඇත. 1987-88 හුබර් එච්. හම්ෆරි සම්මාන සාමාජිකත්වය දිනා ගත්තේ ද ඔහුය.



# Z ලකුණු ගැටලුව සාකච්ඡා කෙරේ

Z - ලකුණු ගැටලුව උග්‍ර හා අහිතකර මානව හා සමාජ ගැටලුවක් බවට පරිවර්තනය වෙමින් පවතින බව ඉකුත් දා පැවැති සම්භාෂණ වැඩසටහනට සහභාගී වූ Z ලකුණු ප්‍රශ්නයෙන් බලපෑමට ලක්වූ සිසුන්, මවුපියන් හා අධ්‍යාපනඥයින් පෙන්වා දුන්හ.

සම්භාෂණ යනු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය සමාජ සංවාදයට ලක්විය යුතු කාලීන ප්‍රශ්න සාකච්ඡා කිරීම වෙනුවෙන් මාසිකව සංවිධානය කරනු ලබන ප්‍රසිද්ධ සාකච්ඡාමය වැඩසටහනකි. එහි මෙවර තේමාව වූයේ '' Z ලකුණු සහ අධ්‍යාපනයේ අර්බුදය'' යන්නය.

මුල් ලැයිස්තුවේ ස්ථාන හිමි බවට සහතික කෙරුණු, එහෙත් පසුව නිකුත් කළ ලැයිස්තුවේ ස්ථාන අහිමි කළ සිසුන් සරසවිවලට ඇතුළත් කර ගත යුතු බවට එහිදී විද්වත් අදහස් පළවිය. යම් හේතුවකට මේ සිසුන් සරසවිවලට ඇතුළත් කර ගැනීමට නොහැකි වුවහොත් ඒ සිසුන් තෝරා ගත් විෂයන් පෞද්ගලික අංශයෙන් හැදෑරීම සඳහා මූල්‍යමය වන්දි ගෙවිය යුතු බවට ද එහිදී අදහස් පළ කළ අය උදක්ම කියා සිටියෝය.

හිටපු විභාග කොමසාරිස්වරයකු වූ ඒ.එම්.ආර්.බී. අමරකෝන්, කොළඹ සරසවියේ මහාචාර්ය සරත් විජේසූරිය සහ ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝශප් ස්ටාලින් යන අය විද්වත් සාකච්ඡා මණ්ඩලයට එක් වූහ. සාකච්ඡා මණ්ඩලයේ මැදිහත්කරු ලෙස කටයුතු කළේ මහාචාර්ය අසංග තිලකරත්නය.

# එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතිය අප ඉන්නේ කොතැනද?

2012 එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී දිනය සැමරීම සඳහා එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියේ ක්‍රියාවලිය සමාලෝචනය කෙරෙන ජාතික උපදේශන වැඩමුළුවක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකාහි මූලිකත්වයෙන් දෙසැම්බර් 9 වැනිදා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී (SLIDA- ස්ලීඩා) පැවැත්වෙයි

අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජෙනරාල් ලක්ෂ්මී ජයවික්‍රම, ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු සභාපති චන්ද්‍රා ජයරත්න, දූෂණ විරෝධී ක්‍රියාකාරිකයකු වන නිහාල් ශ්‍රී අමරසේකර සහ නීතිඥ ජේ.සී. වැලිඅමුණ යන අය මෙහි විද්වත් මණ්ඩලය වශයෙන් සහභාගී වෙති. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකාහි විධායක අධ්‍යක්ෂ එස්. රනුග්ගේ සාකච්ඡා මණ්ඩපයේ මැදිහත්කරු ලෙස කටයුතු කරයි.

2004 මාර්තු 31 වැනිදා සම්මුතිය වලංගු කිරීමෙන් පසු ශ්‍රී ලංකාවත් එහි පාර්ශ්වකරුවකු බවට පත්විය. තම නීතිවලට, ආයතනවලට සහ භාවිතාවන්ට බලපාන දූෂණ විරෝධී පියවර ගැනීමට ගෙවුණු වසර අට පුරා ආණ්ඩුව බැඳී සිටියේය. ස්ථාපිත කිරීමේ සමාලෝචනය සඳහා වන යාන්ත්‍රණයේ සමාලෝචන චක්‍රයට අනුව දූෂණ විරෝධය පිළිබඳ උනන්දුව දක්වන්නන්ගේ, සිවිල් සමාජවල සහ පොදු මහජනතාවගේ පුළුල් සහභාගීත්වයක් ඇතිව සකස් කළ ඇගයීම් වාර්තාවක් 2012 සැප්තැම්බර් අවසාන වන විට ශ්‍රී ලංකාව ඉදිරිපත් කළ යුතුව තිබිණි. එම සමාලෝචනය පිළිබඳ කිසිම තොරතුරක් ආණ්ඩුව මේ දක්වා ප්‍රසිද්ධියට පත් කර නැත.

# ජාතික සුපිළිපන් සම්මාන ප්‍රදානය

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ජාතික සුපිළිපන් සම්මාන ප්‍රදානෝත්සවය දෙසැම්බර් 6 වැනි බ්‍රහස්පතින්දා බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වූ දේශමාන්‍ය බ්‍රැඩ්මන් වීරකෝන් මහතා ප්‍රණාම උළෙලේ ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගී වන අතර, ගෞරවනීය ආරාධිතයා ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා නිර්මාතෘ නීතිඥ අරිත වික්‍රමනායක මහතා සහභාගී වේ.

රටේ විවිධ ප්‍රදේශවලින් ලැබුණු නාමයෝජනා සුපරීක්ෂාකාරීව විමසා බැලීමෙන් පසු වැඩිදුර තොරතුරු ගවේෂණය සඳහා නාමයෝජනා හයක් මෙවර තෝරා ගෙන ගැනුණි. සම්මාන ලාභීන් වශයෙන් අවසාන වශයෙන් තෝරා ගත් අයගේ නම් සම්මාන ප්‍රදානෝත්සවයේදී ප්‍රසිද්ධියට පත් කෙරේ.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හිටපු ලේකම් ඩී. දිසානායක, අජිවා එන්ඩීබී. රක්ෂණ සමාගමේ හිටපු කළමනාකරණ අධ්‍යක්ෂ/කළමනාකරණ උපදේශක දීපාල් සූරියරච්චි, හිටපු දිස්ත්‍රික්ක ලේකම් ජයන්තා බුළුමුල්ල, විශ්‍රාමලත් දිසා විනිසුරු එස්.එච්.එන් ජමීල් සහ ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදී වී. බාලසිංහම් යන අය මෙවර විනිශ්චය මණ්ඩලයට අයත් වූහ.

ජාතික සුපිළිපන් සම්මාන ප්‍රදානය මෙවර පැවැත්වෙන්නේ නව වැනි වරටය. ජයග්‍රාහකයන් 10 දෙනෙකුගේ සහ විශේෂ ඇගයුම් යටතේ 5 දෙනෙකුටද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා විසින් මේ දක්වා උපහාර පුද කර ඇත. ධෛර්යවන්ත සහ එඩිතර රාජ්‍ය නිලධාරීහු, එඩිතර ගවේෂණාත්මක ජනමාධ්‍යවේදීහු සහ සෘජු වෘත්තීය සමිති නායකයෝ ඒ අය අතර වෙති.

# සුපිළිපන්භාවය හා දූෂණය පිළිබඳ තරුණ අදහස් විමසා බලයි



සුපිළිපන්භාවය හා දූෂණය පිළිබඳව තරුණ තරුණියන් දරන අදහස් හඳුනාගැනීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ජාතික තරුණ සේවා සභාව සමග එක්ව සිදුකළ සමීක්ෂණය මේ වන විට අවසන්ව ඇත.

දැනට එම සමීක්ෂණ දත්ත විශ්ලේෂණය කෙරෙමින් පවතින අතර එහි ප්‍රතිඵල ලබන වසර මුලදී මහජනතාව වෙත ඉදිරිපත් කිරීමට ට්‍රාන්සපේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය අපේක්ෂා කරයි.

යෞවන-යෞවනියන් තුළ සුපිළිපන්භාවය වර්ධනය කිරීමේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් වැඩසටහන යටතේ මෙම සමීක්ෂණය පවත්වන ලදී.

තරුණයන් අතර සුපිළිපන් බව වර්ධනය කිරීමත්, ඔවුන් දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වීමට පෙළඹවීමත් මෙම වැඩසටහනේ අරමුණය.

# සුසැරි සෙවන ප්‍රජා සංවිධාන හා අත්වැල් බැඳ ගනී

අල්ලස දූෂණයට හා අක්‍රමිකතාවන්ට එරෙහිව කටයුතු කරන්නන්ට නීතිමය උපදෙස් ලබාදෙන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ සුසැරි සෙවන නීති උපදේශන සේවය රටපුරා ප්‍රචලිත කිරීමේ අරමුණු ඇතිව සහ දූෂණය අවම කරලීමට හා සුපිළිපන් බව වර්ධනය කිරීමට සිවිල් සංවිධාන සමඟ ජාලගත වීමේ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත.

එම වැඩපිළිවෙළ අරඹමින් පොලොන්නරුව සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල පැවති මූලික රැස්වීම්වලට එම ප්‍රදේශවල ප්‍රජා නායකයින් රැසක් එක් වූහ. දේවසරණ සංවර්ධන මධ්‍යස්ථානය කුරුණෑගල රැස්වීම සංවිධානය කර තිබූ අතර පොළොන්නරුව පුරවැසි සංවිධානය විසින් අනෙක් රැස්වීම කැඳවා තිබුණි.

මෙම ජාලය මගින් කොළඹින් බැහැර ප්‍රජා හා සිවිල් සංවිධානයන්ට සුසැරි සෙවන නීති උපදේශන සේවය සමඟ සන්ධාන ගතවීමේ අවස්ථාව සැළසීම හරහා එහි පරිචය පුළුල් කිරීමේ අවස්ථාව සැළසී තිබේ. එමෙන්ම සුසැරි සෙවන නීති උපදේශන සේවයේ අවධානය සහ මැදිහත්වීම අවශ්‍යවන ක්ෂේත්‍රයක් හඳුනාගැනීමටද මෙමඟින් අවස්ථාව සැළසෙනු ඇත.

සුසැරි සෙවන ප්‍රථම අනු කාර්යාලය පසුගියදා මඩකලපුව නගරයේදී ආරම්භ කරන ලදී. එය මඩකලපුව පුම්පගර් පටුමගේ අංක 435/65 A යන ස්ථානයේ පිහිටා තිබෙන අතර දුරකථන අංක 065 2055055 ඔස්සේ ජනතාවට එම කාර්යාලය පහසුවෙන් ඇමතිය හැක.

අල්ලස දූෂණයට හා අක්‍රමිකතාවන්ට එරෙහිව කටයුතු කිරීමට, යම් ආයතනයකට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ නම් එම පැමිණිල්ල ඉදිරියට ගෙන යාමට අවශ්‍ය නීති උපදෙස් සුසැරි සෙවන වෙතින් නොමිලයේ ලබාගත හැකිය.

මෙයට අමතරව විවිධ වර්ගයේ දූෂණ පිළිබඳව සමාජයේ අවධානය වැඩිකරලීමටත් දූෂණයට එරෙහිව ක්‍රියාත්මකවීමේ මහජන වගකීම හා කාර්යභාරය පිළිබඳව දැනුම්වත් කිරීමටත් මෙමඟින් කටයුතු කෙරේ.








# දෝෂාභියෝගය සම්බන්ධව කටයුතු කිරීමේදී දෝෂ රහිත යාන්ත්‍රණයක් අවශ්‍යයි

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රීලංකා අවධාරණය කරයි

අගවිනිසකාරවරියට එරෙහි වර්තමාන දෝෂාභියෝග චෝදනාව විභාග කිරීමේදී සාධාරණය ඉටු වන දෝෂ රහිත යාන්ත්‍රණයක් විකසනය කිරීම අදාළ සියල්ලන්ගේම යුතුකම හා ජාතික වගකීම බව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ, කථානායක සහ පක්ෂ නායකයන් වෙත ලියුමක් යවමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සඳහන් කරයි.

ඉහළ අධිකරණවල විනිසකාරවරුන්ට දෝෂාභියෝග කිරීමේදී වඩා පිළිගත හැකි සහ විචාරශීලි යාන්ත්‍රණයක් අනුගමනය කරන අනෙක් රටවලින් අපට ඉගෙන ගන්නට හැකි බව සඳහන් කරන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා, ඒ සඳහා අනුගමනය කළ හැකි උදාහරණයක් ලෙස සිංගප්පූරුව ගෙන හැර දක්වයි. ඉහළ අධිකරණවල විනිසකාරවරුන්ට එරෙහි දෝෂාභියෝග චෝදනා විභාග කිරීමේදී විශ්‍රාමික සහ සේවයේ යෙදී සිටින විනිසකාරවරුන්ගෙන් සමන්විත අධිකරණයක් යොදා ගැනීමට සිංගප්පූරුවේ ව්‍යවස්ථාව ඉඩ සපයා ඇති බව ද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා පෙන්නා දෙයි.

එම ලියුමේ මෙසේ සඳහන් කරයිඃ

දූෂණයට එරෙහි විශ්වීය ව්‍යාපාරයක ජාතික පාර්ශ්වය වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකාවේ අධිකරණය සහ විධායකය අතර වර්තමාන අර්බුදය කෙරෙහි තම අවධානය යොමු කර ඇත. රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ යහ පාලනයට මෙය ඉතා හානිකර වර්ධනයක් සහ බරපතල තර්ජනයක් පෙන්නුම් කරන බව අපට හැඟේ. ඊටත් වඩා එක්සත් ජාතීන්ගේ සම්මුතීන් කිහිපයක පාර්ශ්වකරුවකු බවට ශ්‍රී ලංකාව පත්ව ඇති අතර, එබඳු සම්මුතීන්වලින් මානව අයිතීන්ට සහ යහපාලන ප්‍රතිපත්තීන්ට ගෞරව කිරීමට අත්සන් තැබූ පාර්ශ්ව සහතික වී සිටින නිසා මේ අභ්‍යන්තර ප්‍රශ්නයේදී ආණ්ඩුව විචාරශීලි ලෙස කටයුතු නොකළ හොත් එය අන්තර් ජාතික ප්‍රජාවගේ අවධානය යොමු කර ගැනීමක් වනු ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසකාරවරුන්ට දෝෂාභියෝග චෝදනා ඉදිරිපත් කිරීමට ව්‍යවස්ථාව මඟින් ඉඩ සලසා ඇති බව සහ වර්තමාන දෝෂාභියෝග යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදන අනුගමනය කරමින් බව අපි මනා අවබෝධයකින් සිටින්නෙමු. දෝෂාභියෝග චෝදනාවක් ඉදිරියට ගෙන යෑමට අනුගමනය කළ යුතු විධිමත් ක්‍රියා මාර්ග පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල සඳහන් කර ඇති බව සහ ගරු කථානායකතුමා එම ස්ථාවර නියෝගවලට අනුව මේ දක්වා ක්‍රියා කර ඇති බව ද අපි හොඳින් දන්නෙමු.

ඉහතින් සඳහන් කළ ස්ථාවර නියෝගවලට අනුව මෙම දෝෂාභියෝග චෝදනාව විමර්ශනය/විභාග කළ යුත්තේ ගරු කථානායකතුමා විසින් පත් කරනු ලබන තේරීම් කාරක සභාවකිනි. අප සියල්ලන්ම දන්නා ආකාරයට තේරීම් කාරක සභාව සමන්විත වන්නේ, දෝෂාභියෝග චෝදනාවේ පැමිණිලිකරුවන් වන ආණ්ඩු පක්ෂයේ බහුතරයක් සහිත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙනි. තවත් ආකාරයකින් කියතොත් මේ සම්බන්ධව පවතින ස්ථාවර නියෝග අනුව විනිසකාරවරුන් වන්නේ පැමිණිලිකරුවන් නැති නම් පෙත්සම්කරුවන්ය. මෙහිදී තේරීම් කාරක සභාවේ තීරණ අපක්ෂපාතී වුවත් ඒවා පක්ෂපාතී, අවිචාරවත් සහ ස්වභාවික නීතියට එරෙහි ඒවා හැටියට අර්ථකථනය කළ හැකි වීම ක්‍රියාවලිය තුළ ඇති බරපතල දෝෂයකි. එසේ නොවෙතත් පවතින ක්‍රියාවලියේ පැහැදිලි දුර්වලතා සහ ඒ ක්‍රියාවලියේ දෝෂාභියෝගයේ ප්‍රතිඵලය නියත වශයෙන්ම විවිධ කෝණවලින් අර්ථ විග්‍රහ කරනු ඇත. අන්තර් ජාතික තලයේ ශ්‍රී ලංකාව මේ මොහොතේ මුහුණ දී සිටින ප්‍රශ්න එබඳු අර්ථ විග්‍රහ මඟින් උග්‍ර බවට පත් කරනු හා අමතර ප්‍රශ්න එකතු කරනු ඇත. ඒ නිසා දෝෂාභියෝගය විභාග කිරීමේදී සාධාරණය ඉටු වන සහ සාධාරණය ඉටු වන බව පෙනෙන්නට තිබෙන දෝෂ රහිත යාන්ත්‍රණයක් විකසනය කිරීම අදාළ සියල්ලන්ගේම යුතුකම හා ජාතික වගකීම බව අපි විශ්වාස කරමු.

ඉහළ අධිකරණවල විනිසකාරවරුන්ට දෝෂාභියෝග ඉදිරිපත් කිරීමේදී වඩා පිළිගත හැකි සහ විචාරශීලි යාන්ත්‍රණ අනුගමනය කරන අනෙක් රටවලින් මේ ප්‍රශ්නයේදී අපට ඉගෙන ගන්නට හැකිය. උදාහරණයක් හැටියට, ඉහළ අධිකරණවල විනිසකාරවරුන්ට එරෙහි දෝෂාභියෝග චෝදනා විභාග කිරීමේදී විශ්‍රාමික හා සේවයේ යෙදී සිටින විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත අධිකරණයක් සඳහා සිංගප්පූරුවේ ව්‍යවස්ථාව (සිංගප්පූරු ව්‍යවස්ථාවේ 98 වැනි වගන්තිය) ඉඩ සලසා තිබීම සඳහන් කළ හැකිය. අපේ ව්‍යවස්ථාවේ 107 වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින්, නව නීති සම්පාදනය කිරීමෙන්, අවශ්‍යතාව වෙනුවෙන් ස්ථාවර නියෝග සංශෝධනය කිරීමෙන් හෝ පවතින ව්‍යවස්ථා ප්‍රතිපාදන ඇතුළතම එබඳු යන්ත්‍රණයක් විකසනය කර ගැනීමට අපේ පාර්ලිමේන්තුවට හැකි බව අපේ දැඩිව විශ්වාස කරමු.

අගවිනිසකාර ශිරානි බණ්ඩාරනායක මහත්මියට සාධාරණත්වය ඉටු කර දීමේ අරමුණ ඇතිව හෘද සාක්ෂියට එකඟව ක්‍රියා කරමින් මේ දෝෂාභියෝග විභාගයේදී අප දෙස බලා සිටින සමස්ත ලෝකයටම "සාධාරණය ඉටු කළ බව" ඔප්පු කරන්නැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා අතිගරු ජනාධිපතිතුමාගෙන්, ගරු කථානායකතුමාගෙන් සහ සියලු පක්ෂ නායකයන්ගෙන් දැඩි ලෙස ඉල්ලා සිටී.

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් වෙබ් අඩවිය රිදී සම්මාන ලබයි

Bestweb.lk 2012 සම්මාන ප්‍රදානයේදී ලාභ නොලබන සහ අධ්‍යාපන අංශයේ රිදී සම්මානය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා වෙබ් අඩවිය වන www.transparency.lk දිනා ගත්තේය.

මෙම සම්මාන ප්‍රදානයේදී ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා වෙබ් අඩවිය මේ අගැයීමට පාත්‍ර වූ දෙවැනි අවස්ථාව මෙය වේ. 2010 වසරේදී ද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා රිදී සම්මානය දිනා ගත්තේය.

මෙම සම්මාන ප්‍රදානය සිදු කරන්නේ ආචාර්ය ආර්.බී. ඒකනායකගේ සභාපතිත්වයෙන් යුත් ශ්‍රී ලංකා ඩෝමේන් රෙජිස්ට්‍රි ආයතනය මඟිනි. ඩෝමේන් ලේඛකාධිකාරී වන්නේ මහාචාර්ය ගිහාන් ඩයස්ය.

